# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත

[සහතිකය සටහන් කළේ 1973 අගෝස්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි

(1973 අගෝස්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ
II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන
**ශ්‍රී ලංකා පදනම් පනත**

[සහතිකය සටහන් කළේ 1973 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 27/72

**ශ්‍රී ලංකා පදනම යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, එහි පරමාර්ථ හා බලතල දැක්වීම පිණිස ද, එයට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනතෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කෙරෙන ශ්‍රී ලංකා පදනම යනුවෙන් හඳුන්වනු ලබන පදනමක් පිහිටුවනු ලැබේ. ශ්‍රී ලංකා පදනම පිහිටුවීම

3. (1) අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන දහයකට නොඅඩු හා පහළොවකට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් පදනම සමන්විත වන අතර, පදනමේ කළමනාකාර මණ්ඩලය ඔවුන්ගෙන් සංයුක්ත වන්නේ ය. පදනමේ සංයුතිය හා කළමනාකාර මණ්ඩලය

(2) එසේ පත් කරනු ලබන සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයෙක් පදනමේ කළමනාකාර මණ්ඩලයේ සභාපති වශයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නේ ය.

(3) පදනමේ කටයුතු පදනමේ කළමනාකාර මණ්ඩලය විසින් කරගෙන යනු ලැබිය යුතු ය.

4. (1) සභාපති ඇතුළු පදනමේ සෑම සාමාජිකයකුම, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, තම පත්වීමේ නියමයන් අනුව තම ධුරය දැරීම හා හිස් කිරීම කළ යුතු අතර අග්‍රාමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක මාර්ගයෙන් ඔහුට තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය. සාමාජිකයකුව සිටීම අවසන් වූ විට නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුසු වන්නේ ය. පදනමේ සාමාජිකයන්ගේ ධුර කාලය.

(2) අග්‍රාමාත්‍යවරයා අග්‍රාමාත්‍ය ධුරය දැරීම අවසන් කළ විට සභාපති ඇතුළුව පදනමේ සියලුම සාමාජිකයන් ධුර හිස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඊළඟට පත්වන අග්‍රාමාත්‍යවරයා විසින් එසේ ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා සාමාජිකයන් පත් කළ යුතු ය.

රජ 22837—1,500 (73/8)

පදනමේ පරමාර්ථ.

5. පදනමේ අරමුණු හා පරමාර්ථ —

(අ) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය පිළිබඳ අවබෝධය හා විශ්වාසය නගා සිටුවීම හා මානව අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම ;

(ආ) එකී කරුණු වැඩි දියුණු කිරීම පිණිස, ජාතිය, ස්ත්‍රී පුරුෂ භාවය, භාෂාව, ආගම, වර්ණය හෝ ලබ්ධිය ගැන නොතකා සියල්ලන්ම සම්බන්ධයෙන් මානව අයිතිවාසිකම් හා නත් වැදෑරුම් මූලික නිදහස පිළිපැදීමෙහි ලා අන්තර් ජාතික අවබෝධය හා සහයෝගය ද ඒ පිළිබඳ විශ්ව ගෞරවය ද නගා සිටුවීම ;

(ඇ) ඒවා වැඩිදියුණු කිරීම අරභයා, පොදු ජනයාට සියලු දැනීම් විෂයයන් සහ සමාජ ප්‍රගතිය පිළිබඳ අධ්‍යාපනය හා දැනීම ලබා දීමටත් ඔවුන් අතර ඒ දැනීම පතුරුවා හැරීම වත් මෙහෙයවීම් දීම සහ ඒවා නගා සිටුවීම

යනු මේවා වන්නේ ය.

පදනමේ බලතල.

6. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පදනමේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීමේ කාර්යය සඳහා පදනමට පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතු ය :—

(අ) ආයතනයක් හෝ ආයතන හෝ අධ්‍යාපන හෝ සමාජ මධ්‍යස්ථාන පිහිටුවීම හෝ පවත්වාගෙන යාම ;

(ආ) ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ලියාපදිංචි කාර්යාලය එකී සමූහාණ්ඩුවේ බොන් නගරයෙහි පිහිටි එකී සමූහාණ්ඩුවේ ප්‍රිඩ්රිච් ඊබර්ට් පදනම සමග හෝ පදනමේ පරමාර්ථම හෝ එවැනි පරමාර්ථ ඇති අන් විදේශීය, ජාත්‍යන්තර හෝ දේශීය සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හා යම් ගිවිසුමකට හෝ එකඟවීමකට ඇතුළත්වීම ;

(ඇ) රැස්වීම්, සාකච්ඡා සම්මේලන, සංචාරක ගමන්, දේශන, සම්මන්ත්‍රණ හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම හෝ සංවිධානය කිරීම ;

(ඈ) ඉගෙනීමේ හැකියාව හෝ දක්‍ෂතාව ඇති සුදුසු ශිෂ්‍යයන්ට ආධාර මුදල්, ප්‍රදාන, ත්‍යාග, ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව හා පහසුකම් මාර්ගයෙන් ආධාර දීම ;

(ඉ) මුදලින් හෝ අන් ආකාරයකින් තෑගි, ආධාර මුදල්, පරිත්‍යාග, සහනාධාර හා දායක මුදල් දීම, ලැබීම හෝ එකතු කිරීම ;

(ඊ) පොත්, සංග්‍රහ, සඟරා හා ලිපි ලේඛන එකතු කිරීම, වර්ග කිරීම, මුද්‍රණය කිරීම, පළකිරීම හා බෙදා හැරීම ;

(උ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු, හා වෙනත් ගනුදෙනු කළහැකි සාධන පත්‍ර පිළියෙළ කිරීම, ලිවීම, පිළිගැනීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම හා නිකුත් කිරීම ;

(ඍ) යම් බැංකුවක හෝ බැංකුවල, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පත් ගිණුමක් හෝ ගිණුම් ආරම්භ කොට පවත්වා ගෙන යාම;

(එ) මිලට ගැනීමෙන්, හුවමාරු කිරීමෙන්, තෑගි කිරීමෙන්, අන්තිම කැමති පත්‍රයකින් පැවරීමෙන් හෝ හිමිකිරීමෙන් හෝ අන් කිසි ආකාරයකින්, කවර හෝ වර්ගයකට හෝ ස්වභාවයකට අයත් යම් චංචල හෝ නිශ්චල දේපළක් පරම හෝ අර්ථලාභී අයිතිකරු වශයෙන් හෝ භාරකරු වශයෙන් හෝ අන් ලෙසකින් අත්කර ගැනීම හා සතුව සිටීම සහ පදනමේ පරමාර්ථවල යහපත පිණිස හෝ ඒවා වැඩිදියුණු කිරීම පිණිස යම් ප්‍රකාශිත භාරයකට යටත්ව හෝ අන් ලෙසකින් ඒ දේපළ සදාකාලිකව හෝ කෙටි කාලයක් සතුව සිටීම හා භුක්ති විඳීම;

(ඒ) පදනම වෙත සතු කරනු ලැබූ හෝ එයට අයත් අරමුදල් ප්‍රමාණවත් සුරැකුම්පත්වල හෝ පදනමේ කාර්යයන් සඳහා උචිත හෝ අවශ්‍ය යම් ඉඩම්, ගොඩනැගිලි, භාණ්ඩ, බඩු බාහිරාදිය හෝ අන් දේපළ මිලට ගැනීම හෝ අත්කර ගැනීම සම්බන්ධයෙන් ආයෝජනය කිරීම;

(ඔ) පදනමට අයත් හෝ පදනම සතු යම් ඉඩමක යම් ගොඩ නැගිල්ලක් හෝ ඉදිකිරීමක් තැනීම හෝ තැනීමට සැලැස්වීම;

(ඕ) පදනමට අයත් හෝ පදනම සතු යම් චංචල හෝ නිශ්චල දේපළක්, ඒ දේපළට අනුයුක්ත යම් භාරයකට යටත්ව, විකිණීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම; හා

(ක) පදනමේ අරමුණු හා පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ වැඩදායී විය හැකි සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

(2) (අ) පදනම විසින්, ආගමික, වාර්ගික හෝ ජාතිවාදී ස්වභාවයකින් යුත් යම් අරමුණක් සඳහා පදනමේ මුදලින් ආධාර නොකළ යුතු ය.

(ආ) පදනම වෘත්තීය සංගමයක් බවට පත් කරනු ලැබිය හැකි යම් නියෝගයක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් පිළිපැදීමට එහි සාමාජිකයන්ට හෝ අන්‍යයන්ට නියම කිරීමේ හෝ සැලැස්වීමේ යම් අරමුණක් හෝ ප්‍රයත්නයක් සම්බන්ධයෙන් පදනම විසින් එහි අරමුදලින් ආධාර නොකළ යුතු ය.

(ඇ) පදනම යම් දේපළක් අත්කර ගතහොත් හෝ සතුව සිටිතහොත් නීතිය අනුව නියම වන යම් බලයක්, අනුමතියක් හෝ කැමැත්තක් නොමැතිව පදනම විසින් ඒ දේපළ විකිණීම, උකස් කිරීම, භාරයකට යටත් කිරීම, බදු දීම හෝ බැහැර කිරීම නොකළ යුතු ය.

පදනමේ අරමුදල.

7. (1) පදනමට අරමුදලක් තිබිය යුතු ය.

(2) ත්‍යාගයක් වශයෙන් හෝ අන් ලෙසකින් හෝ ජාතික රාජ්‍ය සභාව විසින් යෝජනාවක් සම්මත කර ගැනීමෙන් පදනමට කලින් කල ප්‍රදානය කරනු ලබන යම් මුදල් පදනමේ අරමුදලේ කොටසක් වන්නේ ය.

(3) පදනමට අයත් සියලුම මුදල් පදනමේ පරමාර්ථ සඳහා සිවුවීම සඳහාම පමණක් යෙදවිය යුතු ය.

(4) මේ පනත යටතේ පදනමේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා හා එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීමෙහි ලා දරන්නට සිදුවන සියලුම වියදම් ගෙවීම පිණිස පදනම විසින් පදනමේ මුදල් පාවිච්චි කළ හැකි ය.

පදනම සංස්ථාවක් වන බව.

8. 2 වන වගන්තියෙන් පදනමට දෙන ලද නාමයෙන් පදනම සංස්ථාවක් වන්නේ ය. එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. පදනම විසින් ඒ නාමයෙන් නඩු පැවරිය හැකි ය. ඒ නාමයෙන් පදනමට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

පදනමේ මුද්‍රාව.

9. පදනමේ මුද්‍රාව —

(අ) පදනම විසින් කලින් කල නිශ්චය කළ හැකි තැනැත්තකු ගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) පදනම විසින් නිශ්චය කළ හැකි ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) පදනමේ අනුමතිය ඇතිව හා එහි සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

කළමනාකාර මණ්ඩලයේ රැස්වීම සඳහා කාර්ය පරිපාටිය.

10. කළමනාකාර මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ කාර්ය පරිපාටිය විධිමත් කිරීම පිණිස රීති සෑදීමේ බලය කළමනාකාර මණ්ඩලයට තිබිය යුතු ය.

පුරප්පාඩු තිබුණද පදනමට ක්‍රියා කළ හැකි බව.

11. කළමනාකාර මණ්ඩලයේ රීති අනුව පදනමේ රැස්වීමක් සඳහා ගණපූරණයක් සමන්විත වීමට එහි සාමාජික සංඛ්‍යාව ප්‍රමාණවත්ව පවත්නා තාක් කල් පදනමේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම නොතකා පදනම විසින් ක්‍රියා කළ හැකි ය.

පදනමට අවශ්‍ය ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම

12. පදනමේ කාර්යයන් සඳහා අවශ්‍ය යම් ඉඩමක් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලබන අතර ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ජනරජය විසින් අත්කර ගෙන පදනම වෙත පවරනු ලැබිය හැකි ය.

**13.** (1) අමාත්‍යවරයා විසින් විධානය කරනු ලබන ආකාරය හා ක්‍රමය අනුව පදනමේ ගණන් තැබීමට පදනම විසින් සැලැස්විය යුතු ය. ගණන් හා එවා විගණනය කිරීම.

(2) පදනම විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට එහි පොත් තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, ඊලගට එළඹෙන මාර්තු මස තිස් එක් වන දිනට පෙර අයවැය ගිණුමක් හා පළමු කී දින දක්වා පදනමේ වත්කම් හා වගකීම් පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් අඩංගු ශේෂ පත්‍රයක් පිළියෙළ කිරීමට සැලැස්විය යුතු ය. අයවැය ගිණුම හා ශේෂපත්‍රය පදනමේ සභාපති විසින් ද අත්සන් කිරීමට පදනම විසින් බලය පවරනු ලැබූ පදනමේ යම් නිලධරයකු විසින් ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) පදනම විසින් එක් එක් වර්ෂයක් පාසා එහි ගණන් විගණකාධිපතිවරයා ලවා විගණනය කරවා ගත යුතු ය. ඒ ගණන් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයාට සහාය වීමේ කාර්යය සඳහා ඔහු විසින්, ඔහුගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු යම් සුදුසුකම් ලත් විගණකයකුගේ සේවය ලබා ගත හැකි ය.

(4) පදනමේ ගණන් විගණනය කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් දරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් පදනමේ අරමුදලෙන් ඔහුට ගෙවනු ලැබිය යුතු ය. ඒ විගණනයේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් සේවයෙහි යොදවනු ලැබූ යම් සුදුසුකම් ලත් විගණකයකුට ඔහු විසින් ගෙවනු ලැබූ මුදල් කිසිවක් අඩු කිරීමෙන් පසු විගණකාධිපතිවරයා වෙත පදනමෙන් ලැබුණු යම් පාරිශ්‍රමිකයක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යයන් සඳහා "සුදුසුකම් ලත් විගණක" යන යෙදුමෙන්—

(අ) ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි සාමාජිකයකුව, ගණකාධිකාරි කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමිව සිටින පුද්ගලයෙක්; හෝ

(ආ) ඒ ආයතනයේ සාමාජිකයකුව, එක් එක් සාමාජිකයා ගණකාධිකාරී කෙනකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ආයතනයෙහි සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් හිමිව සිටින කොටස්කරුවන්ගෙන් යුත් වර ලත් ගණකාධිකාරීන්ගේ ව්‍යාපාරික ආයතනයක්

අදහස් වේ.

(6) විගණනයේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි විගණකාධිපතිවරයා විසින් සැලකිය හැකි පදනමේ සියලුම පොත්, ඔප්පු, ගිවිසුම්, ගණන්, ගෙවීම් සහතික හා අන් ලේඛන පරීක්ෂා කර බැලීමට විගණකාධිපතිවරයාට හා පදනමේ ගණන් විගණනය කිරීමෙහි ලැ [illegible] වූත යම්. [illegible] ඉඩ තිබිය යුතු අතර. ඒ

කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තමන් දන්නා යම් තොරතුරු පදනමේ සාමාජිකයන් හා නිලධරයන් විසින් ඔවුන් වෙත සැපයිය යුතු ය.

(7) විගණකාධිපතිවරයා විසින් පදනමේ ගණන් පරීක්ෂා කොට—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පහදාදීම් තමා විසින් ලබා ගන්නා ලද්දේ ද නැද්ද යන බව ප්‍රකාශ කරමින් ;

(ආ) වාර්තාවෙහි සඳහන් ගණන් පදනමේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පිළිබිඹු වන සේ නිසි ආකාරයට පිළියෙළ කර තිබේ ද යන බව ප්‍රකාශ කරමින් ; සහ

(ඇ) පදනමේ කටයුතු සහ ගණන් පිළිබඳ යම් පරීක්ෂණයක දී ජාතික රාජ්‍ය සභාවට වැදගත් විය හැකි යයි තමා අදහස් කරන ගණන්වල යම් කරුණකට අවධානය යොමු කරවමින්

වාර්තාවක් සැපයිය යුතු ය.

(8) විගණකාධිපතිවරයා විසින් ස්වකීය වාර්තාව පදනම වෙත යැවිය යුතු ය.

වාර්ෂික වාර්තාව.

14. (1) පදනම විසින්, අමාත්‍යවරයා වෙත සපයනු ලද යම් තොරතුරක් හා ඔහු විසින් දෙන ලද විධාන ඇතුළුව, සම්පූර්ණ වූ වර්ෂය තුළ පදනමේ කටයුතු හා මුදල් පිළිබඳ ලිඛිත වාර්තාවක් වාර්ෂිකව පිළියෙළ කොට—

(අ) ඒ වාර්තාවේ පිටපතක් ;

(ආ) විගණකාධිපතිවරයා විසින් සහතික කරන ලද ඒ වර්ෂය සම්බන්ධයෙන් වූ අයවැය ගිණුමෙහි හා ශේෂපත්‍රයේ පිටපතක් ; හා

(ඇ) විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක්

අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියෙහි සඳහන් වාර්තාවල හා ප්‍රකාශවල පිටපත් ජාතික රාජ්‍ය සභාව ඉදිරියෙහි තැබිය යුතු ය.

රජයේ ඉඩම හා රජයේ ගොඩනැගිලි.

15. පදනමේ කාර්යය සඳහා හෝ පදනමේ යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ පදිංචිය සඳහා රජයේ යම් ඉඩමක් හෝ රජයේ යම් ගොඩනැගිල්ලක්, තත් කාලයෙහි රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව පදනමේ ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට සැලැස්විය හැකි ය ; නැතහොත් පදනම වෙත සතු කරනු ලැබිය හැකි ය.

ඇතැම් තීරු ගාස්තුවලින් හා අයබදුවලින් නිදහස් කිරීම.

16. (1) පදනම විසින් ආනයනය කරනු ලබන යම් බඩු වෙනුවෙන් යම් තීරුබදු ගෙවීමෙන් පදනම නිදහස් කිරීම මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා අනුමත කරයි නම් පදනම ඒ තීරුබදු ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

(2) පදනමේ වැඩ කටයුතුවලට සාමාන්‍ය ආධාර දීමේ දායක මුදලක් වශයෙන් පදනමට ගෙවීමක් කිරීම සඳහා විධිවිධාන සලස්වමින් පදනම හා අන් කිසි තැනැත්තකු අතර වූ එකගවීමක් අඩංගු වන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වූ විට ඒ සාධන පත්‍රය සම්බන්ධයෙන් යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් පදනම හා ඒ අන් තැනැත්තා යන දෙදෙනාම නිදහස් විය යුතු ය.

(3) පදනමේ වැඩ කටයුතුවලට සාමාන්‍ය ආධාර දීමේ දායක මුදලක් වශයෙන් පදනමට ගෙවීමක් කරන යම් තැනැත්තකු විසින්, ගෙවිය යුතු ආදායම් බදු බර ගණන් බැලීමේ කාර්යය සඳහා, එකී ගෙවීම නියම වශයෙන් කරන ලද වර්ෂයෙහි ආදායමෙන් එකී ගෙවීම් ප්‍රමාණය අඩු කිරීමක් වශයෙන් සලකන ලෙස ඉල්ලා සිටිය හැකි අතර, 1963 අංක 4 දරන දේශීය ආදායම් බදු පනතේ කාර්ය යන් සඳහා බදු අය කළ හැකි ත්‍යාගයක් ලෙස ඒ ගෙවීම සලකනු නොලැබිය යුතු ය.

**17.** (1) මේ පනත යටතේ හෝ පදනමේ විධානය අනුව පදනමේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලද ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පැවරීම කළ නොහැකි විය යුතු ය.

මේ පනත යටතේ හෝ පදනමේ විධානය අනුව කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් පදනමේ සාමාජිකයන් යනාදීන්ගේ ආරක්ෂාව සැලසීම.

(2) යම් අධිකරණයක් ඉදිරියේ පදනම විසින් හෝ පදනමට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් පදනම විසින් දරන ලද යම් වියදමක් පදනමේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී පදනමට ගෙවනු ලැබූ හෝ පදනම විසින් අයකර ගනු ලැබූ ගාස්තු කිසිවක් පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ පදනමේ විධානය අනුව කරනු ලැබූ හෝ කරන ලද ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගනිත හොත්, ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී එකී වියදම් ඔහු විසින් අයකර ගන්නා ලද නම් මිස, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**18.** පදනමට විරුද්ධව පවරනු ලැබූ කිසිදු නඩුවක දී පදනමේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

පදනමේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිදු රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**19.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සාමාන්‍යයෙන් ද නියම කරනු ලැබීමට මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත, හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය පවරනු ලැබූ කරුණක් සම්බන්ධයෙන් විශේෂයෙන් ද පදනම විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග.

(2) මේ පනත යටතේ සාදනු ලබන කිසියම් නියෝගයක් එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ජාතික රාජ්‍ය සභාව විසින් ස්ථිර කරනු ලැබ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තෙක් බල නොපැවැත්විය යුතු ය.

සංක්‍රාන්තික විධිවිධාන.

20. (1) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ ඉන් පසු, ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ එකී සමූහාණ්ඩුවේ ප්‍රිඩ්රිච් ඊබට් පදනම විසින් සමාගම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි කරනු ලැබූ හා වගකීමේ සීමාව සහතික කරනු ලැබූ "ලංකා පදනම" යනුවෙන් හැඳින්වෙන සමාගම සමග ගිවිසුම් මගින් ඇතිකරගත් යම් වැඩ පිළිවෙළක් ශූන්‍ය හා බල රහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා පදනම විසින්, ප්‍රිඩ්රිච් ඊබට් පදනම සමග අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ නියමයන් හා කොන්දේසි අනුව, (1) වන උපවගන්තියෙහි සඳහන් වන්නා වූ ගිවිසුම් මගින් ඇතිකරගත් යම් වැඩ පිළිවෙළක් යටතේ ඉටු කළ යුතු වූ යම් වැඩක් අඛණ්ඩව කරගෙන යාම හා කරගෙන යමින් පවත්නා යම් යෝජනා ක්‍රමයක් නිම කිරීම සඳහා අලුත් වැඩපිළිවෙළවල් සකස් කළ හැකි ය.